ඔන්න එකෝමත් එක රටක ගමරාල

කෙනෙක් හිටියා.ගමරාලගෙ ගෙදර හිටියා

බල්ලෙකු යි බූරුවෙකු යි.

බල්ලා හරිම කළුයි ඒ නිසා කවුරුත්

ඌට කීවේ කළුවා කියල.




ගමරාලගෙ ගේ වගේම ගොවිපොල

ආරක්ෂා කළේ කළුව තමයි.



හැබැයි බූරුව ගමරාලගෙ එළවලු,ධාන්‍ය

වගේ දේවල් පොලට ගෙනියනව විතරක්

නෙමෙයි පොලෙන් ගමරාලට අවශ්‍ය

දේ නැවත ගෙදරටත් ගේනව.



ඉතින් රෑට, කළුවා නම් හොඳට නිදියනවා,හැබැයි බූරුවට දවස තිස්සෙම මහන්සි වෙලා රෑට හරියට නිදා ගන්නත් අමාරුයි. බූරුවට යන්තම් හරි නින්ද යන්නෙ මැදියම් රෑ කිට්ටු වෙනකොට තමයි.

ඉතින් දවසක් හොරු රංචුවක් මැදියම්

රෑ ගමරාලගෙ ගෙදරට ආවා වටිනා

කියන දේ පැහරගන්න හිතාගෙන.



මේ වෙලාවෙ කළු හිටියෙ තද නින්දෙ, හැබැයි බූරුවා නම් ඒ වෙලාවෙත් අවදි යෙන්. ඌ හිතුවා කළු දැන් දැන් බුරයි කියලා ,ඒත් කිසිම ශබ්දයක් නෑ ....

අනේ  කළු ඉතින් තද නින්දෙනෙ.....

මේ හොරු ගමරාලගෙ වස්තුව පැහැර ගනීවි කියල හිතුව බූරුවා , ගමරාල අවදිකරගැනීමෙ අරමුනින් හයියෙන් කෑ ගැහුවා.





ඒ අඬට ඇහැරුනු ගමරාලට බූරුවත් එක්ක හරිම කේන්තියි.

ගෙයින් පිටතට ආව ගමරාලට  කිසිම අමුත්තක් දැනුනෙ නෑ.

කළුවත් තද නින්දෙ....

ගමරාල එකවිටම අතට අහුවූ පොල්ල කින් අහිංසක බූරුවට තඩිබෑවා හොඳටම....

බූරුවට එවැනි දෙයක් සිදු වුනේ තමන්ට අයිති නැති දෙයක් කරන්න ගිය නිසා තමයි.

